SLGURU.LK

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## දෙවන වාර පරීක්ෂණය - 2020 - 12 ශ්‍රේණිය
## රසායන විද්‍යාව I

| | | | | |
|---|---|---|---|---|
| (1) - 4 | (11) - 3 | (21) - 2 | (31) - 2 | (41) - 1 |
| (2) - 1 | (12) - 4 | (22) - 4 | (32) - 4 | (42) - 4 |
| (3) - 2 | (13) - 1 | (23) - 2 | (33) - 3 | (43) - 5 |
| (4) - 5 | (14) - 3 | (24) - 4 | (34) - 5 | (44) - 5 |
| (5) - 3 | (15) - 1 | (25) - 5 | (35) - 5 | (45) - 2 |
| (6) - 1 | (16) - 5 | (26) - 3 | (36) - 1 | (46) - 4 |
| (7) - 4 | (17) - 3 | (27) - 1 | (37) - 4 | (47) - 1 |
| (8) - 2 | (18) - 4 | (28) - 2 | (38) - 2 | (48) - 3 |
| (9) - 5 | (19) - 5 | (29) - 3 | (39) - 1 | (49) - 2 |
| (10) - 3 | (20) - 4 | (30) - 1 | (40) - 2 | (50) - 3 |

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

# රසායන විද්‍යාව II
## A කොටස ව්‍යුහගත කොටස

(01) a. I. පහත සඳහන් ප්‍රශ්න ආවර්තිතා වගුවේ තුන්වන ආවර්තයේ මූලද්‍රව්‍ය හා සම්බන්ධ වේ. කොටස් (i) සිට (v) දක්වා පිළිතුරු ලබා දීමේ දී ලබා දී ඇති අවකාශයේ මූලද්‍රව්‍යයේ සංකේතය ලියන්න.

i. අඩුම විද්‍යුත් ඍණතාව ඇති මූලද්‍රව්‍ය හඳුනාගන්න. (උච්ඡ වායුව නොසළකා හරින්න.)

Na

ii. ප්‍රමාණයෙන් කුඩාම ඒක පරමාණුක අයනය සාදන මූලද්‍රව්‍ය හඳුනාගන්න. (මෙම අයනය ස්ථායි විය යුතුය.)

Al

iii. $p$ ඉලෙක්ට්‍රෝන නොමැති නමුත් ස්ථායි වින්‍යාසයක් ඇති මූලද්‍රව්‍ය හඳුනාගන්න.

Mg

iv. දෙවැනියට වැඩිම පළමු අයනීකරණ ශක්තිය ඇති මූලද්‍රව්‍ය හඳුනාගන්න.

Cl

v. වායුමය අවස්ථාවේ දී ද්වි අවයවික වශයෙන් පවතින ඉලෙක්ට්‍රෝන ඌන සංයෝග සාදන මූලද්‍රව්‍ය හඳුනා ගන්න.

Al

@ 04 x 5 = 20

(b) $CH_2NO_2^-$ අයනය සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් තිත් - ඉරි ව්‍යුහය අඳින්න.

I. එහි සැකිල්ල පහත දක්වා ඇත.





(06)

II. $H_3CN_2O$ අණුව සඳහා වඩාත්ම ස්ථායි ලුවිස් තිත් - ඉරි ව්‍යුහය පහත දක්වා ඇත. මෙම අණුව සඳහා තවත් ලුවිස් තිත් - ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) දෙකක් අඳින්න. ඔබ විසින් අඳින ලද වඩාත් අස්ථායි ව්‍යුහය යටින් 'අස්ථායි' ලෙස ලියන්න.





(04) (04)

අස්ථායි . (02)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

III. පහත සඳහන් ලුවිස් තිත් - ඉරි ව්‍යුහය පදනම් කරගෙන වගුවේ ඇති $C, N$ හා $O$ පරමාණුවල,
i. පරමාණුව වටා $VSEPR$ යුගල්
ii. පරමාණුව වට ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය
iii. පරමාණුව වටා හැඩය
iv. පරමාණුවේ මුහුම්කරණය සඳහන් කරන්න.
v. පරමාණුවේ ඔක්සිකරණ අංකය සඳහන් කරන්න.



පහත දැක්වෙන පරිදි පරමාණු අංකනය කර ඇත.



| | $O^1$ | $C^2$ | $C^3$ | $N^5$ |
|---|---|---|---|---|
| $VSEPR$ යුගල් | 4 | 2 | 2 | 4 |
| ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | චතුස්තලීය | රේඛීය | රේඛීය | චතුස්තලීය |
| හැඩය | කෝණික | රේඛීය. | රේඛීය. | ත්‍රිආනති පිරමිඩීය |
| මුහුම්කරණය | sp3 | sp | sp | sp3 |
| ඔක්සිකරණ අංකය | -2 | +1 | 0 | +1 |

(@ 01 x 20 = 20)

IV. ඉහත (III) කොටසෙහි ලුවිස් තිත් - ඉරි ව්‍යුහයෙහි පහත සඳහන් $\sigma$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක / මුහුම් කාක්ෂික හඳුනාගන්න. (පරමාණුවල අංකනය $(III)$ කොටසෙහි ආකාරයටම වේ.)

i. $H - O^1$ $H$ ...1s පා.කා.... $O^1$ ...sp3 මු.කා....
ii. $O^1 - C^2$ $O^1$ ...sp3 මු.කා.... $C^2$ ...sp මු.කා....
iii. $C^2 - C^3$ $C^2$ ...sp මු.කා.... $C^3$ ...sp මු.කා....
iv. $C^3 - C^4$ $C^3$ ...sp මු.කා.... $C^4$ ...sp2 මු.කා....
v. $C^4 - N^5$ $C^4$ ...sp2 මු.කා.... $N^5$ ...sp3 මු.කා....
vi. $C^4 - O$ $C^4$ ...sp2 මු.කා.... $O$ ...2p පා.කා. හෝ sp2 මු.කා.

(@ 01 x 12 = 12)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

V. ඉහත (III) කොටසෙහි දෙන ලද ලුවිස් තිත් - ඉරි ව්‍යුහයෙහි පහත සඳහන් $\pi$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න. (පරමාණුවල අංකනය (III) කොටසෙහි ආකාරයටම වේ.)

I. $C^2 - C^3$ $C^2$ ...2p පාකා... $C^3$ ...2p පාකා...

II. $C^4 - O^6$ $C^4$ ...2p පාකා... $C^6$ ...2p පාකා...

(ල : 01×4 = 4)

VI. i. ඉහත (III) කොටසෙහි දෙන ලද ලුවිස් තිත් - ඉරි ව්‍යුහයෙහි ත්‍රිත්ව බන්ධනයේ $\pi$ බන්ධන දෙක දිශානත වී ඇත්තේ කෙසේද?

...එකිනෙකට ලම්බකව... (ල : 02)

ii. එකිනෙකට වෙනස් පරමාණු 2 ක් අතර ත්‍රිත්ව බන්ධනයක් සහිත අණුවක් / අයනයක් සඳහා උදාහරණයක් දෙන්න.

...HCN හෝ නිවැරදි පිළිතුරක... (ල : 02)

සැ.යු. ඔබේ උදාහරණයෙහි පරමාණු 3 කට වඩා අඩංගු නොවිය යුතුයි.

ඔබ දෙන උදාහරණයේ ඇති මූලද්‍රව්‍ය ආවර්තිතා වගුවේ පළමුවන හා දෙවන ආවර්තවලට සීමා විය යුතුය.

(c) i. පරමාණුක කාක්ෂිකයක් විස්තර කරනුයේ $n$, $l$ සහ $m_l$ ක්වොන්ටම් අංක තුන මගිනි. අදාල ක්වොන්ටම් අංක සහ පරමාණුක කාක්ෂිකයේ නම පහත දැක්වෙන කොටුවල ලියන්න.

| | $n$ | $l$ | $m_l$ | කාක්ෂිකය |
|---|---|---|---|---|
| 1. | 4 | 1 | −1 | 4P |
| 2. | 4 | 2 | 0 | 4d |
| 3. | 3 | 0 | 0 | 3s |

(ල : 01×6 = 6)

ii. වරහන් තුළ දක්වා ඇති ගුණය වැඩිවන පිළිවෙලට පහත සඳහන් දෑ සකසන්න. (හේතු අවශ්‍ය නොවේ.)

I. $BeCO_3$ , $MgCO_3$ , $CaCO_3$ (වියෝජන උෂ්ණත්වය)

$BeCO_3$ < $MgCO_3$ < $CaCO_3$

II. $N^+O_2$ , $NO_2$ , $NO_2^-$ ($O\hat{N}O$ බන්ධන කෝණය)

$NO_2^-$ < $NO_2$ < $NO_2^+$

III. $C_2H_6$ , $C_2H_4$ , $C_2H_2$ ($C-C$ බන්ධන දිග)

$C_2H_2$ < $C_2H_4$ < $C_2H_6$ (ල : 06×3 = 18)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(02) a. X යනු ආවර්තිතා වගුවේ $s$ – ගොණුවේ මූලද්‍රව්‍යයකි. $X$ හි පළමු දෙවැනි හා තුන්වැනි අයනීකරණ ශක්තීන් පිළිවෙලින් $kJ\ mol^{-1}$ වලින්, 519 , 7300 , 11800. $H_2(g)$ මුදා හරිමින් හා එහි හයිඩ්‍රොක්සයිඩය සාදමින් $X$ ජලය සමඟ ප්‍රබල නොවන ප්‍රතික්‍රියාවක් සිදු කරයි. හයිඩ්‍රොක්සයිඩය භාස්මික වේ. $X$ තනුක අම්ල සමඟ ප්‍රතික්‍රියාවේ දී $H_2(g)$ මුදා හැරේ. $X$ වාතයේ දහනය වී ඝන සංයෝග දෙකක මිශ්‍රණයක් ලබා දේ. එම සංයෝග දෙක ජලයට එක් කළ විට Y නැමැති භාස්මික වායුවක් පිටවේ.

i. $X$ හඳුනාගන්න.

Li (ල : 07)

ii. $X$ හි භූමි අවස්ථාවේ ඉලෙක්ට්‍රොනික වින්‍යාසය ලියන්න.

$1s^2 2s^1$ (ල : 04)

iii. $X$ වාතයේ දහනයේ දී සෑදෙන සංයෝග දෙකෙහි රසායනික සූත්‍ර ලියන්න.

$Li_2O$ (ල 03) හා $Li_3N$ (ල : 03)

iv. $s$ ගොණුවේ $X$ අයත්වන කාණ්ඩය හැරුණු විට අනෙක් කාණ්ඩයෙහි මූලද්‍රව්‍යයන්හි දී ඇති සංයෝග සළකන්න. කාණ්ඩයේ පහළට යාමේ දී දක්වා ඇති ගුණය වැඩිවේ ද අඩුවේ ද යන්න දී ඇති කොටු තුළ සඳහන් කරන්න.

1. සල්ෆයිටවල ජලයේ ද්‍රාව්‍යතාවය | අඩුවේ | (ල . 03)
2. හයිඩ්‍රොක්සයිඩවල ජලයේ ද්‍රාව්‍යතාවය | වැඩිවේ | (ල . 03)
3. ලෝහ නයිට්‍රේටවල තාප ස්ථායිතාවය | වැඩිවේ | (ල . 03)

3 හි ඔබගේ පිළිතුරට හේතුව දක්වන්න.

කැටායනයේ අරය කාණ්ඩය පහළට වැඩිවේ. ල . 03

ධ්‍රැවීකරණ බලය අඩුවේ. ල . 02 } 08

ඇනායනයේ ඉලෙක්ට්‍රෝන වලාව විකෘති වීම අඩුවේ තාප ස්ථායිතාව වැඩිවේ ල . 03

v. $H_2(g), O_2(g)$ හා $N_2(g)$ සමඟ $X$ ට බොහෝ දුරට සමාන ලෙස ප්‍රතික්‍රියා කරන නමුත් $X$ අඩංගු කාණ්ඩයට අයත් නොවන ආවර්තිතා වගුවේ $s$ – ගොනුවේ මූලද්‍රව්‍ය හඳුනාගන්න.

Mg (ල . 04)

vi. ඉහත $Y$ නමැති භාස්මික වායුව කුමක්ද?

$NH_3$ (ල . 04)

vi. $Y$ හඳුනා ගැනීම සඳහා පරීක්ෂණයක් දෙන්න.

වායුව තෙත රතු ලිට්මස් අල්ලීම හෝ සාන්ද්‍ර HCl තැබීම නිවැරදි පිළිතුරක් (ල . 04)

viii එම පරීක්ෂණයේ නිරීක්ෂණය කුමක්ද?

රතු ලිට්මස් නිල් පැහැ වේ. (ල : 04)

සුදු ධූම නිකුත් වීම නිවැරදි නිරීක්ෂණය.

ඉහත (i) සිට (v) දක්වා ලකුණු ලබාදීමට (i) නිවැරදි විය යුතුය.
ඉහත (vi) සිට (viii) දක්වා 5 ලකුණු ලබාදීමට (vi) නිවැරදි විය යුතුය.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(b) $A$ සිට $E$ දක්වා නම් කර ඇති පරීක්ෂණ නල වල $Na_2SO_4$ , $Na_2SO_3$ , $NaOH$, $K_2CrO_4$ හා $Ca(NO_3)_2$ හි (පිළිවෙලින් නොවේ) ජලීය ද්‍රාවණ අඩංගු වේ. $A$ සිට $E$ දක්වා ඇති එක් එක් පරීක්ෂා නළයට අදාළ පරීක්ෂණය හා අදාල නිරීක්ෂණ පහත දී ඇත.

| පරීක්ෂා නලය | පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|---|
| A | $BaCl_2$ ද්‍රාවණ ද්‍රාවණ $1\ cm^3$ එකතු කරන්න. ඉන්පසු තනුක $HCl$ එකතු කරන්න. | සුදු පැහැති අවක්ෂේපයක් ලැබී පසුව එය දියවේ. |
| B | $Mg(NO_3)_2$ ද්‍රාවණය එකතු කරන්න. | සුදු පැහැති අවක්ෂේපයක් ලැබේ. |
| C | $BaCl_2$ ද්‍රාවණ $1\ cm^3$ පමණ එකතු කරන්න. ඉන්පසු ත. $HCl$ එකතු කරන්න. | සුදු පැහැති අවක්ෂේපයක් සෑදේ. එය දිය නොවේ. |
| D | $Na_2CO_3$ $1\ cm^3$ ක් පමණ එකතු කරන්න. | සුදු පැහැති අවක්ෂේපයක් ලැබේ. |
| E | $BaCl_2$ ද්‍රාවණ $1\ cm^3$ එකතු කරන්න. | කහ පැහැති අවක්ෂේපයක් ලැබේ. |

(i) $A$ සිට $E$ දක්වා පරීක්ෂා නල වල ද්‍රාවණ හඳුනාගන්න.

$A$ $Na_2SO_3$ $B$ $NaOH$

$C$ $Na_2SO_4$ $D$ $Ca(NO_3)_2$

$E$ $K_2CrO_4$ (@ : 05 × 5 = 25)

(ii) $A, B, C, D$ හා $E$ පරීක්ෂණ නළ වල සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික / අයනික සමීකරණය ලියන්න.

$Na_2SO_3 + BaCl_2 \longrightarrow BaSO_3 + 2NaCl$

$2NaOH + Mg(NO_3)_2 \longrightarrow Mg(OH)_2 + 2NaNO_3$

$Na_2SO_4 + BaCl_2 \longrightarrow BaSO_4 + 2NaCl$

$Ca(NO_3)_2 + Na_2CO_3 \longrightarrow CaCO_3 + 2NaNO_3$

$BaCl_2 + K_2CrO_4 \longrightarrow BaCrO_4 + 2KCl$

(@ : 05 × 5 = 25)

(03) (a) I. විද්‍යාගාරයේ දී $1\ moldm^{-3}$ $Na_2CO_3$ ද්‍රාවණ $250\ cm^3$ සෑදීම සඳහා ඝන $Na_2CO_3.5H_2O$ සපයා ඇත. ($Na = 23$, $C = 12$, $O = 16$, $H = 1$)

i. අවශ්‍ය කරන $Na_2CO_3$ $mol$ ගණන කොපමණද?

$n = C \cdot V$

$= 1\ mol\ dm^{-3} \times 250 \times 10^{-3}\ dm^3$

$= 0.25\ mol$ (@ . 05 × 2 = 10)

ii කිරාගත යුතු $Na_2CO_3.5H_2O$ ස්කන්ධය කොපමණද?

$M(Na_2CO_3 \cdot 5H_2O) = (23\times2) + 12 + (16\times3) + (5\times18) = 196$

$m = n \cdot M = 0.25\ mol \times 196\ g\ mol^{-1}$

$m = 49\ g$

(7 × 2 = 14 ඉතිරි ඒකකය 1) = (@ . 15)



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

iii. ප්‍රාමාණික ද්‍රාවණයක් යනු කුමක්ද?

හරියටම දන්නා සාන්ද්‍රණයකින් යුත් ද්‍රාවණ (ල 05)

iv. ප්‍රාථමික සම්මත ද්‍රාවණයක් යනු කුමක්ද?

ප්‍රාථමික ද්‍රාවණ පිළියෙල කිරීම සඳහා අධිශෝධිත, ස්ථායි, ජලාකර්ෂක නොවූ, ඉහළ මවුලික ස්කන්ධයක් හා ඉහළ ජල ද්‍රාව්‍යතාවක් ඇති ද්‍රව්‍ය භාවිත කරන අතර ප්‍රාථමික සම්මත ද්‍රව්‍යයක් ලෙස හැඳින්වේ. (ල 15)

v. ප්‍රාථමික සම්මත සඳහා උදාහරණ 02 ක් දෙන්න.

$Na_2CO_3$, $K_2Cr_2O_7$, $KIO_3$

ඕනෑම 2 ට (ල : 05×2 = 10)

vi. $NaOH$ හි නිවැරදි සාන්ද්‍රණයෙන් යුත් සම්මත ද්‍රාවණයක් පිළියෙල කර ගත නොහැක්කේ මන්ද?

$CO_2$ අවශෝෂණය සාන්ද්‍රණය වෙනස් විය හැකි නිසා. (ල 10)

vii. ඉහත සාදන ලද $1\ mol\ dm^{-3}\ Na_2CO_3$ ද්‍රාවණයේ සාන්ද්‍රණය කුඩා ප්‍රමාණයකින් වෙනස් විය හැක. එයට හේතු 2 ක් දෙන්න.

- $Na_2CO_3.5H_2O$ සංශුද්ධ නොවීම.
- බැඳී ඇති ජල අණු ප්‍රමාණය වෙනස් වීම. (ල : 05×2 = 10)

viii. දන්නා සාන්ද්‍රණයෙන් යුත් ද්‍රාවණයක් පිළියෙල කිරීමට භාවිතා කරන වීදුරු උපකරණය කුමක්ද?

පරිමාමිතික ප්ලාස්කුව. (ල : 10)

ix. ඉහත $1\ mol\ dm^{-3}\ Na_2CO_3$ ද්‍රාවණය භාවිතා කර $0.25\ mol\ dm^{-3}\ Na_2CO_3\ 100\ cm^3$ ක් සාදා ගැනීම සඳහා එම ද්‍රාවණයෙන් ලබා ගත යුතු පරිමාව ගණනය කරන්න.

$C_1V_1 = C_2V_2$ (ල 05)

$1\ mol\ dm^{-3} \times V = 0.25\ mol\ dm^{-3} \times 100\ cm^3$ (ල 4+1)

$V = 25\ cm^3$ ල : (04+1)

* වෙනත් ක්‍රම යොදා ඇත්නම් ද ලකුණු ප්‍රදානය කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(04) කිසියම් සංයෝගයක ස්කන්ධය අනුව 30.46% ක් නයිට්‍රජන් ද, 69.54% ඔක්සිජන් ද වේ. සංයෝගයේ සාපේක්ෂ අණුක ස්කන්ධය 90 - 95 අතර වේ.

i. සංයෝගයේ ආනුභවික සූත්‍රය සොයන්න. ($N = 14, O = 16$)

| | N | O |
|---|---|---|
| | 30.46% | 69.54% |
| ස්කන්ධය | 30.46 g | 69.54 g |
| $n = \frac{m}{M}$ | $\frac{30.46\ g}{14\ g\ mol^{-1}}$ | $\frac{69.54\ g}{16\ g\ mol^{-1}}$ |
| | 2.17 mol | 4.34 mol |
| අනුපාතය | 1 | 2 |

ආනුභවික සූත්‍රය = $NO_2$

ii. සංයෝගයේ අණුක සූත්‍රය සොයන්න.

(ආනුභවික සූ. ස්කන්ධය × n) = සා. අ. ස්.

$[14 + (16 \times 2)]n = 90 - 95$

$46n \simeq 90 - 95$

$n \simeq \frac{90-95}{46} = 2$

∴ අණුක සූත්‍රය $= NO_2 \times 2 = N_2O_4$

iii. සංයෝගයේ නිවැරදි මවුලික ස්කන්ධය කොපමණද? ($N = 14, O = 16$)

$N_2O_4 = ((14 \times 2) + (16 \times 4))\ g\ mol^{-1}$

$= 92\ g\ mol^{-1}$

(ල: 02×10 = 20)

(b) I. $KMnO_4$ වර්ණවත් සංයෝගයකි.

i. $KMnO_4$ හි *IUPAC* නාමය ලියන්න.

potassium permanganate (ල: 05)

ii. $KMnO_4$ තුළ *Mn* හි ඔක්සිකරණ අංකයෙන් ව්‍යුත්පන්න වන ඔක්සයිඩයේ රසායනික සූත්‍රය ලියන්න.

MnO (ල: 05)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

iii. $Mn$ හි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය $1s^2\ 2s^2$ ……… යන සාමාන්‍ය ආකාරයට ලියන්න.

$1s^2 2s^2 2p^6 3s^2 3p^6 3d^5 4s^2$ (ල. 05)

iv. ආම්ලික මාධ්‍යයේ දී $K_2Cr_2O_7$ අයන $K_2C_2O_4$ සමඟ ප්‍රතික්‍රියා කරයි.

$(Cr_2O_7^{2-} \rightarrow Cr^{3+})$

$(C_2O_4^{2-} \rightarrow CO_2)$ බවට පත් වේ.

1. ඔක්සිකරණ අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

$C_2O_4^{2-} \rightarrow 2CO_2 + 2e$ (ල. 10)

(C: +3 → +4)

2. ඔක්සිහරණ අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

$14H^+ + Cr_2O_7^{2-} + 6e \rightarrow 2Cr^{3+} + 7H_2O$ (ල. 10)

(Cr: +6 → +3)

3. තුලිත අයනික සමීකරණය ලියන්න.

$14H^+ + Cr_2O_7^{2-} + 3C_2O_4^{2-} \rightarrow 6CO_2 + 2Cr^{3+} + 7H_2O$

(ල. 05)

4. ආම්ලික මාධ්‍ය ලෙස තනුක $H_2SO_4$ භාවිතා කළේ නම්, තුලිත රසායනික සමීකරණය ලියන්න.

$7H_2SO_4 + K_2Cr_2O_7 + 3K_2C_2O_4 \rightarrow 6CO_2 + Cr_2(SO_4)_3 + 7H_2O + 4K_2SO_4$

(ල. 05)

(c) $298\,K$ දී $2NH_3(g) \rightarrow N_2(g) + 3H_2(g)$ යන ප්‍රතික්‍රියාව සඳහා සම්මත මවුලික එන්තැල්පි විපර්යාසය $90\ kJ\ mol^{-1}$ වේ. $298\,K$ දී සම්මත එන්ට්‍රොපි විපර්යාසය $250\ J\ mol^{-1}\ K^{-1}$ වේ.

i. ප්‍රතික්‍රියාව සඳහා $\Delta G^\theta$ ගණනය කරන්න. (ල. 05)

$\Delta G^\theta = \Delta H^\theta - T\Delta S^\theta$

$= (90\ kJ\ mol^{-1} - 298\ K \times 250 \times 10^{-3}\ kJ\ mol^{-1} K^{-1})$ ල (04+1)

$= 15.5\ kJ\ mol^{-1}$ (ල. 04+1)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

ii. 298 $K$ දී ප්‍රතික්‍රියාවේ ස්වයංසිද්ධතාව පැහැදිලි කරන්න.

$\Delta G = +$ බව එනම් ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ නොවේ.

(ල: 05)

iii. මෙම ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධව සිදුවීම සඳහා අවශ්‍ය කරන අවම උෂ්ණත්වය ගණනය කරන්න.

ස්වයංසිද්ධ නම් $\Delta G < 0$ වේ. (ල - 03)

$\Delta H - T\Delta S < 0$ (ල - 03)

$\Delta H < T\Delta S$

$\frac{\Delta H}{\Delta S} < T$ (ල - 03)

$\frac{90\ kJ\ mol^{-1}}{0.25\ kJ\ mol^{-1}\ K^{-1}} < T$ ල(02+1)

$360\ K < T$ (ල: 03)

NWP-EXAM

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

රසායන විද්‍යාව - 2020.
12 - ශ්‍රේණිය - II වාරය.
රචනා - පිළිතුරු.

(5) (a). (i). A බඳුනට, $PV = nRT$ යෙදීම,

$1.6 \times 10^5\ N m^{-2} \times 4.157 \times 10^{-3}\ m^3 = n_A \times 8.314\ J mol^{-1} K^{-1} \times 400 K$

$NH_3$ මවුල ($n_A$) = 0.2 mol

B බඳුනට,

$2.4 \times 10^5\ N m^{-2} \times 8.314 \times 10^{-3}\ m^3 = n_B \times 8.314\ J mol^{-1} K^{-1} \times 400 K$

$Cl_2$ මවුල ($n_B$) = 0.6 mol. (ලකුණු 3×5 = 15)

(ii). I. $NH_3(g) + 3Cl_2(g) \rightarrow NCl_3(l) + 3HCl(g)$

| | | | | |
|---|---|---|---|---|
| ආරම්භක මවුල | 0.2 | 0.6 | - | - |
| අවසාන මවුල | - | - | 0.2 | 0.6 |

බඳුන් තුළ මුළු වායු සංඛ්‍යාව = 0.8 mol

(ලකුණු 5×3 = 15).

II. අවසාන පද්ධතියට $PV = nRT$

$p \times 12.471 \times 10^{-3}\ m^3 = 0.8\ mol \times 8.314\ J mol^{-1} K^{-1} \times 400 K$

$p = 2.13 \times 10^5\ Pa$.

(ලකුණු 20).

III. පද්ධතිය තුළ $Cl_2(g)$ හා $NH_3(g)$ සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා කර අවසන්ව ඇත. $NH_3(g)$ එකතු කළ විට ඉතිරි $Cl_2(g)$ නොපවතින බැවින් ප්‍රතික්‍රියාවක් සිදු නොවේ. තවත් $NH_3(g)$ 0.4 mol ක් එකතු කිරීම මගින් ඇති ආංශික පීඩනය, මුළු පීඩනයට එකතු වේ. ∴ මුළු පීඩනය වැඩිවේ.

(ලකුණු 10).

IV. පද්ධතියට, $PV = nRT$

$p \times 12.471 \times 10^{-3}\ m^3 = 1.2\ mol \times 8.314\ J mol^{-1} K^{-1} \times 400 K$

(ල. 8).

$p = 3.2 \times 10^5\ N m^{-2}$ (ල. 7).

SLGURU.LK
For Educational Purpose Only

ල.ක. 75

SLGURU.LK

(b). (i).




(ලකුණු 20).

(ii). $Mg_{(s)} + 2HCl_{(aq)} \rightarrow MgCl_{2(aq)} + H_{2(g)}$ (ලකුණු 5).

(iii). $P_{H_2} = P_T - P_{H_2O}$

$= 1.013 \times 10^5 \, pa - 0.036 \times 10^5 \, pa$

$= 0.977 \times 10^5 \, pa$ ✓

$H_2(g)$ ට $PV = nRT$

$0.977 \times 10^5 \, pa \times 50 \times 10^{-6} \, m^3 = n \times 8.314 \, J mol^{-1} K^{-1} \times 300 K$ ✓

$n = 0.002 \, mol$ ✓ (0.0019).

Mg : $H_2$ මවුල අනුපාතය,

1 : 1 බැවින්,

Mg මවුල $= 0.002 \, mol$ ✓

Mg මවුල $= \dfrac{\text{Mg ස්කන්ධය}}{\text{Mg සා.ප.ස.}}$

$0.002 \, mol = \dfrac{0.05 g}{\text{Mg සා.ප.ස.}}$

∴ Mg සා.ප.ස. = 25 ✓ (ලකුණු 5×5=25)

(iv) $H_2$ වායුව පරිපූර්ණ ලෙස උපකල්පනය. (ල.5).

SLGURU.LK
For Educational Purpose Only

ලකුණු 55

SLGURU.LK

(c). (i). උපකල්පන.

* අණු වල සත්‍ය පරිමාව එවා අතර ඇති හිස් අවකාශ වලට සාපේක්ෂව ඉතා කුඩාය.

* වායු අණු එකිනෙක සමග හෝ භාජනයේ බිත්ති සමග සංඝට්ටනය වන තුරු සෑම විටම වායු අණුවක් සරල රේඛීයව චලනය වේ.

* වායු අණු එකිනෙක සමග හෝ භාජනයේ බිත්ති සමග සිදුවන සංඝට්ටන පූර්ණ ප්‍රත්‍යාස්ථ වේ.

* වායු අණු අතර ආකර්ෂණ බල හෝ ප්‍රාකර්ෂණ බල නොපවතී.

* වායු අණු බඳුනේ බිත්තිය සමග සිදු කරන සියලු සංඝට්ටන හේතුවෙන් වායුව මගින් පීඩනයක් ඇතිවේ.

(ලකුණු 2×5=10).

(ii). $PV = \frac{1}{3} m N \overline{c^2}$ (ලකුණු 05)

P = පීඩනය.
V = වායුවේ පරිමාව.
m = වායු අණුවක | අණුවක ස්කන්ධය.
N = මුළු වායු අණු | අණු සංඛ්‍යාව.
$\overline{c^2}$ = වර්ග මධ්‍යන්‍ය ප්‍රවේගය. (ලකුණු 05).

ලකුණු 20

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(6) (a).

(i). $C_{(s)} + O_{2(g)} \rightarrow CO_{2(g)}$ ; $\Delta H^\ominus_C$

(ii). $Na_{(s)} \rightarrow Na_{(g)}$ ; $\Delta H^\ominus_S$

(iii). $O_{2(g)} \rightarrow 2O_{(g)}$ ; $\Delta H^\ominus_D$

(iv). $\frac{1}{2}Cl_{2(g)} \rightarrow Cl_{(g)}$ ; $\Delta H^\ominus_{atm}$

(v). $MgCl_{2(s)} \rightarrow Mg^{2+}_{(g)} + 2Cl^-_{(g)}$ ; $\Delta H^\ominus_{L}$

(ලකුණු 5×5 = 25).

ලකුණු 25

(b). (i). $2H_{2(g)} + O_{2(g)} \xrightarrow{\Delta H^\ominus_f} 2H_2O_{(g)}$

$2H_{2(g)} + O_{2(g)} \rightarrow 4H_{(g)} + 2O_{(g)}$ : $2 \times 432\ kJmol^{-1} + 494\ kJmol^{-1}$ ✓

$2H_2O_{(g)} \rightarrow 4H_{(g)} + 2O_{(g)}$ : $4 \times 460\ kJmol^{-1}$ ✓

$4H_{(g)} + 2O_{(g)}$.

ප්‍රභේද ප්‍රකාශය 2×3 = 06

ඊතල සම්බන්ධ 2×2 = 04

හෙස් නියමය මගින්,

$\Delta H^\ominus_f + 4 \times 460\ kJmol^{-1} = 2 \times 432\ kJmol^{-1} + 494\ kJmol^{-1}$ ✓

$\Delta H^\ominus_f + 1840 = 864 + 494$

$\Delta H^\ominus_f = 1358 - 1840$

$\Delta H^\ominus_f = -482\ kJmol^{-1}$ ✓

ලකුණු 5×2 = 10.

විකල්ප පිළිතුර.

$\Delta H^\ominus_f = \Sigma \Delta H^\ominus_{D(\text{ප්‍රතික්‍රියක})} - \Sigma \Delta H^\ominus_{D(\text{ප්‍රතිඵල})}$ ✓

$= 2 \times 432\ kJmol^{-1} + 494\ kJmol^{-1} - 4 \times 460\ kJmol^{-1}$

$= 864 + 494 - 1840$

$= -482\ kJmol^{-1}$ ✓

(ලකුණු 4×5 = 20)

(3)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(ii). $\Delta S_r^\ominus = S^\ominus_{(ජලය)} - S^\ominus_{(ප්‍රතික්‍රියක)}$

$= 2 \times 188.8\ J K^{-1} mol^{-1} - \{2 \times 130.7\ J K^{-1} mol^{-1} + 205.1\ J K^{-1} mol^{-1}\}$

$= 377.6 - \{261.4 + 205.1\}$

$= 377.6 - 466.5$

$= -88.9\ J K^{-1} mol^{-1}$

(ලකුණු 4×5 = 20)

(iii). $\Delta G_r^\ominus = \Delta H_r^\ominus - T \Delta S_r^\ominus$

$= -482\ kJ mol^{-1} - 298\ K \times (-88.9\ J mol^{-1} K^{-1})$

$= -482\ kJ mol^{-1} + 26492.2\ J mol^{-1}$

$= (-482 + 26.49)\ kJ mol^{-1}$

$= -455.51\ kJ mol^{-1}$

(ලකුණු 2×5 = 10)

$\Delta G_r^\ominus < 0$ බැවින්,

ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධව සිදුවේ. (ලකුණු 05)

ලකුණු 55

(c).




$\Delta H_r^\ominus + 2 \times (-349\ kJ mol^{-1}) + 1451\ kJ mol^{-1} + 738\ kJ mol^{-1} + 244\ kJ mol^{-1}$
$+ 148\ kJ mol^{-1} = -641\ kJ mol^{-1}$

(ලකුණු 5×2 = 10)

$\Delta H_r^\ominus = -2524\ kJ mol^{-1}$

$\Delta H_1^\ominus = +2524\ kJ mol^{-1}$

ලකුණු 70

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(7) (a)

(i). $HNO_3 + KOH \rightarrow KNO_3 + H_2O$. (ලකුණු 5)

(ii). $Q = mc\Delta T$ ✓ (ලකුණු 4)

$= 250\,cm^3 \times 1\,g\,cm^{-3} \times 4.2\,J\,K^{-1}g^{-1} \times (313 - 300)\,K$

$= 13650\,J$

$= \underline{13.65\,kJ}$ ✓ (ලකුණු 2×5=10).

(iii). දුන් $HNO_3$ මවුල $= \frac{2 \times 125}{1000}$

$= 0.25\,mol$ ✓

$HNO_3$ 0.25 mol මගින් පිටවන තාපය = 13.65 kJ

$HNO_3$ 1 mol ක් මගින් පිටවන තාපය $= \frac{13.65\,kJ}{0.25\,mol}$ ✓

$= 54.6\,kJ\,mol^{-1}$

∴ සම්මත උදාසීනකරණ එන්තැල්පිය $= \underline{-54.6\,kJ\,mol^{-1}}$ ✓
(ලකුණු 5×3=15)

(iv) I. ප්‍රතික්‍රියාවේ මුදාහරින තාපය මුළුමනින්ම ද්‍රාවණය විසින් උරා ගන්නා බව (පොලිස්ටයිරීන් භාජනය තාපපරිවාරක බව හා අවට පරිසරයට තාපය හානි නොයන බව) ✓

II. ද්‍රාවණ ද්‍රාවණයේ ඝනත්වය, ජලයේ ඝනත්වයට සමාන යැයි ද ද්‍රාවණයේ වි.තා.ධා. ජලයේ වි.තා.ධා.ට සමාන යැයි ද සැලකීම. ✓ (ලකුණු 5×2=10)

(v). මෙලෙස සම්මත අගයෙන් වෙනස් වීමට හේතු වනුයේ අම්ලය සහ භෂ්මය ප්‍රතික්‍රියාවෙන් පිටවන තාපයෙන් කොටසක් පොලිස්ටයිරීන් භාජනයට හා පරිසරයට හානිවීමයි. (ලකුණු 5).

(vi). $CH_3COOH(aq) + NaOH(aq) \rightarrow CH_3COONa(aq) + H_2O(l)$ ✓

ඇසිටික් දුබල අම්ලයක් ✓ බැවින්, ප්‍රතික්‍රියාවේ දී පිටවන තාපයෙන් කොටසක් එහි විඝටනය සඳහා ලබා ගනී. ✓ එබැවින් සම්මත උදාසීනකරණ එන්තැල්පිය $-57\,kJ\,mol^{-1}$ ට වඩා කුඩා ✓ අගයක් ගනී.

$H_2SO_4(aq) + Ba(OH)_2(aq) \rightarrow BaSO_4(s) + 2H_2O(l)$ ✓

මෙහි දී ✓ $H_2O(l)$ හි මවුල 2 ක් ✓ සෑදීමත් $BaSO_4(s)$ අවක්ෂේප වීමත් නිසාවෙන් සම්මත එන්තැල්පි අගය ✓ $-114\,kJ\,mol^{-1}$ ට වඩා වැඩි අගයක් ගනී. (ලකුණු 2×8=16)

ලකුණු 65

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(b) (i) $2KNO_3 (s) \xrightarrow{\Delta} 2KNO_2 (s) + O_2 (g)$. ✓

$5NO_2^- + 6H^+ + 2MnO_4^- \rightarrow 5NO_3^- + 2Mn^{2+} + 3H_2O$ ✓

(ලකුණු 10×2=20)

(ii). වැයවූ $KMnO_4$ මවුල $= \frac{0.015}{1000} \times 30$ ✓

$= 4.5 \times 10^{-4}$ mol ✓

∴ ද්‍රාවණ 25 $cm^3$ හි $NO_2^-$ මවුල $= \frac{4.5 \times 10^{-4} mol \times 5}{2}$ ✓

$= 11.25 \times 10^{-4}$ mol

ද්‍රාවණ 250 $cm^3$ හි $NO_2^-$ මවුල $= \frac{11.25 \times 10^{-4} mol \times 250}{25}$ ✓

$= 11.25 \times 10^{-3}$ mol ✓

∴ $KNO_2$ මවුල $= 11.25 \times 10^{-3}$ mol ✓

වියෝජනය වූ $KNO_3$ මවුල $= 11.25 \times 10^{-3}$ mol. ✓

∴ වියෝජනය වූ $KNO_3$ ස්කන්ධය $= 11.25 \times 10^{-3} mol \times 101 g mol^{-1}$ ✓

$= 1.13$ g ✓

ඉතිරිව පවතින $KNO_3$ ස්කන්ධය $= 1.55g - 1.13g$.

$= \underline{0.42 g}$ ✓

(ලකුණු 3×10=30)

ලකුණු 50

(c) (i). $6e + Cr_2O_7^{2-} + 14H^+ \longrightarrow 2Cr^{3+} + 7H_2O$

(ලකුණු 10)

(ii) $2H_2O + MnO_4^- + 3e \longrightarrow MnO_2 + 4\bar{O}H$

(ලකුණු 10)

(iii). $I_2 + 2Na_2S_2O_3 \longrightarrow 2NaI + Na_2S_4O_6$

(ලකුණු 15).

ලකුණු 35

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(8) (a)

(i) $2Mg(NO_3)_2(s) \xrightarrow{\Delta} 2MgO(s) + 4NO_2(g) + O_2(g)$

(ii) $2NaNO_3(s) \xrightarrow{\Delta} 2NaNO_2(s) + O_2(g)$

(iii) $2NaHCO_3(s) \xrightarrow{\Delta} Na_2CO_3(s) + H_2O(g) + CO_2(g)$.

(iv) $4LiNO_3(s) \xrightarrow{\Delta} 2Li_2O(s) + 4NO_2(g) + O_2(g)$

(v) $CaCO_3(s) \xrightarrow{\Delta} CaO(s) + CO_2(g)$.

(ලකුණු 10×5 = 50).

[ලකුණු 50]

(b) (i) (i). $Ba^{2+}$ හෝ $Sr^{2+}$ අයනය වේ.

(ii). වායුව $NO_2$ වන නිසා ලවණය $Ba(NO_3)_2$ හෝ $Sr(NO_3)_2$ විය යුතුය.

(iii). පහන් සිළු පරීක්ෂාවට කොළ-කොළ පාට දැල්ලක් ලබාදෙනුයේ $Ba^{2+}$ අයනය වේ.

(ලකුණු 5×6=30)

(ii). ලවණය - $Ba(NO_3)_2$. (ලකුණු 10).

(iii). I. $Ba(NO_3)_2 + Na_2SO_4 \rightarrow BaSO_4 + 2NaNO_3$

II. $2Ba(NO_3)_2(s) \xrightarrow{\Delta} 2BaO + 4NO_2 + O_2$

(ලකුණු 10×2 = 20)

[ලකුණු 60]

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(c) (i) $2KNO_3(s) \xrightarrow{\Delta} 2KNO_2(s) + O_2(g)$ ✓

$x$ mol  $x$ mol

$2Ca(NO_3)_2(s) \xrightarrow{\Delta} 2CaO(s) + 4NO_2(g) + O_2(g)$ ✓

$y$ mol  $y$ mol

(ලකුණු $3 \times 2 = 6$)

$KNO_3$ මවුල $= x$ mol

$Ca(NO_3)_2$ මවුල $= y$ mol

$101x + 164y = 2.84$ —① ✓

$85x + 56y = 1.98$ —② ✓

(ලකුණු $4 \times 2 = 8$)

① × 85 − ② × 101,

$8284y = 41.42$

$y = 0.005$ mol ✓

∴ $Ca(NO_3)_2$ ස්කන්ධය $= 0.005 \text{ mol} \times 164 \text{ g mol}^{-1}$ ✓

$= \underline{0.82 \text{ g}}$ ✓

$Ca(NO_3)_2$ ස්කන්ධ ප්‍රතිශතය $= \frac{0.82 \text{ g}}{2.84 \text{ g}} \times 100\%$ ✓

$= \underline{28.87\%}$ ✓

∴ $KNO_3$ ස්කන්ධ ප්‍රතිශතය $= 100 - 28.87$

$= \underline{71.13\%}$ ✓

(ලකුණු $3 \times 6 = 18$)

(ii) දුඹුරු පැහැති වායුවක් පිටවීම. (ලකුණු 8).

**ලකුණු 40**

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(09).

(a) (i) $Be(NO_3)_2$ $Mg(NO_3)_2$ $Ca(NO_3)_2$

$Be^{2+}$ $NO_3^-$ $Mg^{2+}$ $NO_3^-$ $Ca^{2+}$ $NO_3^-$

මෙහි ඇනායනය පොදු වේ. ($NO_3^-$) ✓

කැටායන වල අරය,

$Be^{2+} < Mg^{2+} < Ca^{2+}$ ✓

∴ ධ්‍රැවීකරණ බලය,

$Be^{2+} > Mg^{2+} > Ca^{2+}$ ✓

සහසංයුජ ලක්ෂණ $BeCO_3 > MgCO_3 > CaCO_3$

අයනික ලක්ෂණ $BeCO_3 < MgCO_3 < CaCO_3$ ✓

∴ තාප ස්ථායිතාව $BeCO_3 < MgCO_3 < CaCO_3$ ✓

(ii) $NaOH$ $KOH$ $Mg(OH)_2$ (ලකුණු 2×5=10).

මෙහි $OH^-$ ඇනායනය පොදු වේ. ✓

∴ කැටායන අරය. $Mg^{2+} < Na^+ < K^+$ ✓

ධ්‍රැවීකරණ බලය $Mg^{2+} > Na^+ > K^+$ ✓

∴ සහසංයුජ ලක්ෂණ $Mg(OH)_2 > NaOH > KOH$

අයනික ලක්ෂණ $Mg(OH)_2 < NaOH < KOH$. ✓

$OH^-$ නිදහස් කිරීමේ හැකියාව, (භාෂ්මිකතාව).

$Mg(OH)_2 < NaOH < KOH$. ✓

* විද්‍යුත් සෘණතා අගයන් පදනම් කරගනිමින් නිවැරදි පිළිතුරු ලබා ගත හැක. (ලකුණු 2×5=10).

(iii). $PF_3$ $PCl_3$ $PI_3$

| | | | |
|---|---|---|---|
| මුහුම්කරණය | $sp^3$ | $sp^3$ | $sp^3$ ✓ |
| පරමාණු මත ආරෝපණය | 0 | 0 | 0 ✓ |
| ඔ. අංකය | +3 | +3 | +3 ✓ |

∴ P වල විද්‍යුත් සෘණතාව සංසන්දනයට පොදු හා ප්‍රතිශත P-X සම්බන්ධිත අනෙක් පරමාණු වල විද්‍යුත් සෘණතාවයි. ✓ විද්‍යුත් සෘණතාව F > Cl > Br ලෙස විචලනය

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

එනිසා, $PF_3 > PCl_3 > PI_3$ ලෙස P මත δ+ ආරෝපණය වැඩිවේ. ∴ විද්‍යුත් සෘණතාවය,

$$PF_3 > PCl_3 > PI_3$$ ✓

(ලකුණු 2×7=14).

(iv). $H_2O$ හි හයිඩ්‍රජන් බන්ධන ඇත.

$H_2S$ හා $H_2Se$ හි ප්‍රබල ද්විධ්‍රැව - ද්විධ්‍රැව ආකර්ෂණ බල ඇත. නමුත් $H_2S$ ට වඩා $H_2Se$ හි මවුලික ස්කන්ධය වැඩි වීම නිසා $H_2Se$ හි ද්විධ්‍රැව - ද්විධ්‍රැව ආකර්ෂණ බල $H_2S$ ට වඩා වැඩිවේ. $H_2S$ හා $H_2Se$ හි පවතින ද්විධ්‍රැව - ද්විධ්‍රැව ආකර්ෂණ බලවලට වඩා $H_2O$ හි හයිඩ්‍රජන් බන්ධන ප්‍රබල බැවින් එය වාෂ්ප කිරීම දුෂ්කරය. ∴ තාපාංකය,

$$H_2O > H_2Se > H_2S$$ ✓

(ලකුණු 2.5×6 = 15)

මුළු ලකුණු 49

(b) (i).

| | $Na_2CO_3(aq)$ | $Na_2SO_4(aq)$ | $BaCl_2(aq)$ | $NaNO_3(s)$ |
|---|---|---|---|---|
| $Na_2CO_3(s)$ | - | - | $BaCO_3(s)$ සුදු | - |
| $Na_2SO_4(aq)$ | - | - | $BaSO_4(s)$ සුදු | - |
| $BaCl_2(aq)$ | $BaCO_3(s)$ සුදු | $BaSO_4(s)$ සුදු | - | - |
| $NaNO_3(aq)$ | - | - | - | - |

(ලකුණු 10).

ද්‍රාවණ දෙකක් බැගින් යුගල වශයෙන් මිශ්‍ර කිරීමේදී සුදු පැහැති අවක්ෂේප 2ක් ලැබෙනුයේ $BaCl_2(aq)$ එකතු කිරීමේ දීය. ලැබෙන සුදු පැහැති අවක්ෂේප වලට ත. $HNO_3$ එකතු කිරීමේ දී අවක්ෂේපය දිය නොවේ නම් එය $BaSO_4(s)$ බවත් ද්‍රාවණය තුළ $Na_2SO_4$ අඩංගු බවත් තහවුරු වේ. සුදු අවක්ෂේපය, ත. $HNO_3$ එකතු කිරීමේ දී ද්‍රාව්‍ය වේ නම් එය $BaCO_3(s)$ බවත් ද්‍රාවණය තුළ $Na_2SO_4(aq)$ අඩංගු බවත් තහවුරු වේ. ද්‍රාවණ යුගල වශයෙන් මිශ්‍ර කිරීමේ දී කිසිදු අවක්ෂේපයක් ලබා නොදෙනුයේ $NaNO_3$ (aq) මගින්.

(ලකුණු 2×7=14).

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(ii).

| | $Na_2CrO_4(aq)$ | $MgCl_2(aq)$ | $Ba(NO_3)_2(aq)$ | $Na_2CO_3(aq)$ |
|---|---|---|---|---|
| $Na_2CrO_4(aq)$ | – | – | $BaCrO_4(s)$ කහ | – |
| $MgCl_2(aq)$ | – | – | – | $MgCO_3(s)$ සුදු |
| $Ba(NO_3)_2(aq)$ | $BaCrO_4(s)$ කහ | – | – | $BaCO_3(s)$ සුදු |
| $Na_2CO_3(aq)$ | – | $MgCO_3(s)$ සුදු | $BaCO_3(s)$ සුදු | – |

(ලකුණු 2.5×4 = 10).

එකිනෙකට වෙනස් ද්‍රාවණ යුගල වශයෙන් මිශ්‍ර කිරීමේ දී කහ පාට අවක්ෂේපයක් පමණක් ලැබේ නම් අදාළ ද්‍රාවණය $Na_2CrO_4(aq)$ වේ. සුදු පැහැති අවක්ෂේපයක් පමණක් ලැබේ නම් $MgCl_2(aq)$ වේ. මිශ්‍ර කිරීමේ දී සුදු අවක්ෂේප 2ක් ලැබේ නම් අදාළ වූ ද්‍රාවණය $Na_2CO_3(aq)$ වන අතර සුදු පැහැති හා කහ පැහැති දෙපාට අවක්ෂේප යුගලයක් ලැබෙනුයේ $Ba(NO_3)_2(aq)$ අදාළ කිරීමේ දී ය.

(ලකුණු 2×9 = 18).

(iii). $2Mg(NO_3)_2(aq) \xrightarrow{\Delta} 2MgO(s) + 4NO_2(g) + O_2(g)$

$2NaNO_3(aq) \xrightarrow{\Delta} 2NaNO_2(s) + O_2(g)$

$Na_2CO_3(aq) \xrightarrow{\Delta} \times$

රත් කිරීමේ දී කිසිදු විපර්යාසයක් සිදු නොවනුයේ $Na_2CO_3(aq)$ වලිනි. රත් කිරීමේ දී දුඹුරු පැහැති වායුවක් පිට වේ නම් එය $Mg(NO_3)_2$ වන අතර ඝන ශේෂයක් සමඟ අවර්ණ වායු පිටවීමක් දක්නට ලැබෙනුයේ $NaNO_3(aq)$ වලිනි.

(ලකුණු 4×6 = 24).

මුළු ලකුණු 76

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(c). (i). $NaHCO_3$ - Sodium hydrogen carbonate.

(ii). $CuSO_4$ - Copper(II) sulfate.

(iii). $CuCl$ - Copper(I) Chloride

(iv). $Fe_2(SO_4)_3$ - iron(III) sulfate.

(v). $KMnO_4$ - patassium permanganate

(ලකුණු 5×5 = 25).

---

(10). (a).

(i) $XeF_4$



මධ්‍ය පරමාණුව වටා මුළු e යුගල් ගණන = 6

VSEPR යුගල් = 6

σ බන්ධන = 4

එකසර යුගල් = 2 (ලකුණු 2×3=6)

∴ හැඩය තලීය සමචතුරස්‍රාකාර වේ.

(ලකුණු 4).

(ii). $PF_5$



P වටා මුළු e යුගල් ගණන = 5

VSEPR යුගල් = 5

σ බන්ධන = 5

එකසර යුගල් = 0

∴ හැඩය ත්‍රිආනති ද්විපිරමිඩාකාර වේ.

(iii). $NCl_3$



N වටා මුළු e යුගල් ගණන = 4

VSEPR යුගල් = 4

σ බන්ධන = 4

එකසර යුගල් = 0

∴ හැඩය ත්‍රිආනති පිරමිඩාකාර වේ.

(iv). $ClO_4^-$



Cl වටා මුළු e යුගල් ගණන = 7

VSEPR යුගල් = 4

σ බන්ධන = 4

එකසර යුගල් = 0

∴ හැඩය චතුස්තලීය වේ.

(v).



N වටා මුළු e යුගල් ගණන = 4

VSEPR යුගල් = 3 (ලකුණු 10×5)

σ බන්ධන = 3 [මුළු ලකුණු 50]

එකසර යුගල් = 0

(8) ∴ හැඩය තලීය ත්‍රිකෝණාකාර වේ.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(b). $Cr_2O_3$ මවුල $= \frac{1.52g}{152 g mol^{-1}}$

$= 0.01 mol$ ✓

$H_2O$ මවුල $= \frac{0.72g}{18 g mol^{-1}}$

$= 0.04 mol$ ✓

$N_2$ මවුල $= \frac{0.28g}{28 g mol^{-1}}$

$= 0.01 mol$ ✓

$Cr_2O_3 : H_2O : N_2$ මවුල අනුපාතය,

$0.01 : 0.04 : 0.01$

$1 : 4 : 1$ ✓

∴ $Cr : H : N : O$ පරමාණු මවුල අනුපාතය, $2 : 8 : 2 : 7$

∴ අනුභවික සූත්‍රය $Cr_2H_8N_2O_7$ ✓ (ලකුණු 4×5=20)

X හි අණුක සූත්‍රය, $Cr_2H_8N_2O_7$

$(NH_4)_2Cr_2O_7$ ✓ (ලකුණු 10)

[ලකුණු 30]

(c). $2KMnO_4 + 5C_2O_4^{2-} + 16H^+ \rightarrow 2Mn^{2+} + 10CO_2 + 8H_2O + 2K^+$ ✓

$KMnO_4 : C_2O_4^{2-}$ මවුල අනුපාතය, (ලකුණු 15)

$2 : 5$ ✓

ද්‍රාවණයේ $25 cm^3$ ක් අනුමාපනයට වැය වූ $C_2O_4^{2-}$ මවුල $= \frac{0.02}{1000} \times 15$ ✓

$= 3 \times 10^{-4} mol$ ✓

∴ ද්‍රාවණ $25 cm^3$ තුළ $KMnO_4$ මවුල $= \frac{3 \times 10^{-4} mol}{5} \times 2$ ✓

$= 1.2 \times 10^{-4} mol$ ✓

ද්‍රාවණ $100 cm^3$ තුළ $KMnO_4$ මවුල $= \frac{1.2 \times 10^{-4} mol}{25 cm^3} \times 100 cm^3$ ✓

$= 4.8 \times 10^{-4} mol$ ✓

∴ සාම්පලය තුළ ඇති $KMnO_4$ ස්කන්ධය,

$= 4.8 \times 10^{-4} mol \times 158 g mol^{-1}$ ✓

$= 0.07584 g$

$= 75.84 mg$ ✓

$KMnO_4$ හි ස්කන්ධ ප්‍රතිශතය $= \frac{75.84 mg}{200 mg} \times 100\%$ ✓

$= 37.92\%$ ✓

(ලකුණු 5×11=55)

[ලකුණු 70]

SLGURU.LK
For Educational Purpose Only

“Education is simply the soul of a society as it passes from one generation to another.” — G.K. Chesterton

Visit SLGURU.LK to download papers and notes.